# Singhalese - Warts

වයිරස ආසාදනය



## ඉන්නා

### වැදගත් කරුණු

- ඉන්නා සමේ ඇතිවන වයිරස ආසාදනයකි
- ඉන්නන් තුනෙන් දෙකක් පමණ කිසිම ප්‍රථිකාරයක් නොමැතිව වසර දෙකකදී කැළලක් නොමැතිව මැකී යයි
- කැළලක් ඇති නොවන ඉන්නන් සායම් කිරීම වැනි ප්‍රතිකාර අගනේය

### එවා මොනවාද?

වයිරස ආසාදනයකින් හට ගන්නා ඉන්නන් දරුවන්ට පොදුය. උපතේදී හෝ  ළමා කාලයට පෙර ඇතිවීම දුර්ලබ අතර බොහෝවිට දරුවන් වයසින් වැඩීමේදී මතුවේ.

එවා තදය, ඝණ කොරපොතු සහිත පිටිතලයක සමෙන් ඉස්මතුවී ඇති වර්ණවත් ලකුණුය. සම තුවාලවූ තැන්හී හටගන්නා අලුත් ඉන්නන් සමග එවායේ ප්‍රමාණය සහ ගණන වෙනස්වේ. සමේ ඕනෑම තැනක එවා හටගනී, එහෙත් පොදු වශයෙන් ළමයින්ගේ අත්වල සහ දනිස් වල හට ගනී. යටිපතුලේ හට ගන්නා ඉන්නන් පාදක ඉන්නන් හෙවත් (plantar warts) වශයෙන් හැඳින්වේ. ඉන්නන්, කුඩා, පැතලි, සමේ පාට ලකුණු වශයෙන් අත්වල හෝ මුහුනේ ඇතිවිය හැක.

### එවා බෝවන්නේ කෙසේද?

ඉන්නා විශේෂයෙන් දැනටමත් තුවාලවී ඇති සම මතට ඇතුල්වන වර්ගයේ වයිරස ආසාදනයකි.  ප්‍රධාන වශයෙන් සම තුවාලවී ඇත්නම් වෙනත් කෙනෙකුගේ ඉන්නෙක් අතපත ගෑමෙන් සෘජුව බෝවිය හැක. එය අනියම් ස්පර්ෂයකින්ද බෝවිය හැක. බොහෝ විට මෙම වයිරසය තෙතමනය ඇති ස්ථානවල වැඩෙන අතර පිහිනුම් තටාක අවට, නාන කාමර පොලොව ආදියෙහි පවතී. මෙම ස්ථානවල පාවහන් රහිතව ඇවිදීමෙන් බෝවිය හැක. නියපොතු හපන ළමයින්ගේ නිය අවට හෝ ඇඟිලි උරන ළමයින්ගේ තොල්වල සෑදිය හැක.

### එවා වලක්වා ගත හැක්කේ කෙසේද?

නාන බේසම පාවිච්චියෙන් පසුව හොඳින් පවිත්‍ර කිරීම, තුවා හවුලේ පාවිච්චි නොකිරීම සහ පිහිනීමේදී හෝ නෑමෙදී ඉන්නන් ආවරනය කර තබා ගැනීමෙන් එය පැතිරීමෙන් වලක්වා ගත හැක. ඉන්නන් පැලැස්තරයකින් වසා තැබීමෙන් ළමයින් එය අතපත ගෑම වලක්වා ගත හැක.

### එවාට ප්‍රථිකාර ලබා ගන්නේ කෙසේද?

අඩුම වශයෙන් තුනෙන් දෙකක ඉන්නන් කිසිම ප්‍රථිකාරයක් නොමැතිව හා කැළලක් නොමැතිව වසර දෙකකදී මැකී යයි. මේ හේතුව නිසා සෑම ඉන්නෙකුටම ප්‍රථිකාර කිරීමට අවශ්‍ය නොවේ.  ඖෂධ වේදියකුගෙන් වට්ටෝරුවක් නොමැතිව ලබා ගන්නා ඉන්නන් සායම හෙවත් wart paints හොඳ ආරම්භයකි. කෙසේ වෙතත් එක් එක් ඉන්නන් වඳ කිරීම සඳහා නොකඩවා මාස කීපයක් ආලේප කළ යුතුය. ඉන්නන් සායම ආලේප කිරීමට පෙර

**Singhalese - Warts**

ඉන්නා උණු වතුරෙන් පොගවා විධිවත්ව ඉන්නා මතුපිට ඇති අප්‍රාණික සම ඉවත් කිරීමෙන් සායම ඇතුලට කා ගැනීමට උපකාරවේ.

ඉන්නා වේදනා ගෙන දෙන්නේ නම් හෝ සිත්තැවුලක් නම් වෛද්‍ය වරයකුගේ ප්‍රථිකාර වලට නයිට්‍රොජනික ද්‍රව්‍ය වලින් මිදෙන්නට සැළැස්වීම අඩංගුය. කෙසේ වෙතත් එය වේදනා ගෙන දෙන පිළිවෙතක් වන අතර ළමයින්ට සුදුසු නැත. පිලිස්සීම, කපා දැමීම හෝ මට්ටම කිරීම ළමුන් සඳහා වන අවම පොදු ප්‍රථිකාරයක් වන අතර දිගු කලක් පැල්ලමක් තිබිය හැක.

## වැඩිපුර තොරතුරු

ඔබේ මාතෘ සහ ළමා සෞඛ්‍ය හෙදිය
ඔබේ ඖෂධ වේදියා

ඔබේ පවුලේ දොස්තර මයා/මිය
චර්ම රෝග විශේෂඥයෙක් (A dermatologist)

© 2002, Department of Dermatology, St. Vincent's Hospital Melbourne, Victoria Parade, Fitzroy, Victoria 3065 Australia.